# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ආයුර්වේද (සංශෝධන)

**1961 අංක 31 දරන ආයුර්වේද පනත සංශෝධනය කිරීම සඳහා වූ**
**පනත් කෙටුම්පතකි**

---

සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් 2023 ජූලි මස 05 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 ජූනි මස 12 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[184 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 60.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

*2 වන වගන්තිය:* මේ වගන්තිය මගින් (මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) ආයුර්වේද කායික වෛද්‍ය විද්‍යා සහ ශල්‍ය වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයේ ඇතැම් වෘත්තික කණ්ඩායම් සහ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ සිදු කරන ඇතැම් ක්‍රියාකාරකම්, එකී වෘත්තික කණ්ඩායම් සහ ක්‍රියාකාරකම් ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවක් නියම කිරීම මගින් නියාමනය කිරීම;

(ආ) පනත යටතේ පිළිගනු ලබන පාඨමාලා වර්ග පුළුල් කිරීම; සහ

(ඇ) ආයුර්වේද රෝහල් නැවත ශ්‍රේණිගත කිරීම,

වේ.

*3 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතැම් වචන ඊ පද සඳහා පොදු සංශෝධනයක් කිරීමට විධිවිධාන සලස්වනු ලබන අතර, එකී නව වචන සහ පද මගින් අනෙකුත් ලිඛිත නීති සහ ලේඛන මත ඇති නීතිමය බලපෑම දක්වාලයි.

*4 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ආයුර්වේද කොමසාරිස්වරයාගේ තනතුර ඉහළ දැමීම සහ නිලධාරීන් සඳහා නව ශ්‍රේණි හඳුන්වාදීම ය.

*5 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය, 3 වන වගන්තිය මගින් කරනු ලබන සංශෝධනවලට ආනුෂංගික වේ.

*6 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය, 3 වන වගන්තිය මගින් කරනු ලබන සංශෝධනවලට ආනුෂංගික වේ.

*7 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ප්‍රතියෝජනය කරන ලද පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ පනතේ අරමුණු නැවත සකස් කිරීම වේ.

*8 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එහි නීතිය බලපෑම වනුයේ ඒකාබද්ධ අරමුදලින් ලබා දෙන ප්‍රදාන සහ ඒකාබද්ධ අරමුදලට බැර කරන මුදල් සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

*9 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයාගේ විෂයපථය තුළට පර්යේෂණයේ සහ ව්‍යාප්තිය සඳහා වන ඖෂධ උයන් ගෙන ඒම වේ.

*10 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය, 3 වන වගන්තිය මගින් කරනු ලබන සංශෝධනවලට ආනුෂංගික වේ.

*11 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ආයුර්වේද වෛද්‍ය සභාවේ සංයුතිය ප්‍රතිව්‍යුහගත කිරීම යි.

*12 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 11 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***13 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, එය 11 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***14 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ආයුර්වේද වෛද්‍ය සභාවේ ගණපූරණය යළි නියම කිරීම යි.

***15 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය, 3 වන වගන්තිය මගින් කරනු ලබන සංශෝධනවලට ආනුෂංගික වේ.

***16 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ආයුර්වේද අධ්‍යාපන සහ ආරෝග්‍යශාලා මණ්ඩලයේ සංයුතිය ප්‍රතිව්‍යුහගත කිරීම යි.

***17 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 22 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***18 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 22 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***19 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ආයුර්වේද අධ්‍යාපන සහ ආරෝග්‍යශාලා මණ්ඩලයේ ගණපූරණය යළි නියම කිරීම යි.

***20 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ආයුර්වේද අධ්‍යාපන සහ ආරෝග්‍යශාලා මණ්ඩලයේ බලතල පුළුල් කිරීම යි.

***21 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ආයුර්වේදපර්යේෂණ කමිටුවේ සංයුතිය ප්‍රතිව්‍යුහගත කිරීමයි.

***22 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ආයුර්වේද පර්යේෂණ කමිටුවේ ගණපූරණය යළි නියම කිරීම යි.

***23 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, එහි සඳහන් කාරණා සම්බන්ධයෙන් වන ගාස්තු අය කිරීමට හැකිවන සේ එකී වගන්තියේ විෂයපථය පුළුල් කිරීම වේ.

***24 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ආයුර්වේද විශේෂඥ වෛද්‍යවරුන් සඳහා නව නාමලේඛනයක් හඳුන්වා දීමෙන් එකී වගන්තියේ විෂයපථය වැඩිදියුණු කිරීම වේ.

***25 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 51 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***26 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 18 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***27 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 18 වන වගන්තියට සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***28 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තියේ විෂයපථය පුළුල් කිරීමෙන් එකී වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***29 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියේ විෂයපථය පුළුල් කිරීමෙන් එකී වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***30 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන සහ 56 වන වගන්තිවලට සිදු කරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

***31 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 18 වන වගන්තියට සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***32 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 18 වන සහ 51 වන වගන්තිවලට සිදු කරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

***33 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ආයුර්වේද වෛද්‍ය සභාවට, ආයුර්වේද අධ්‍යාපන සහ ආරෝග්‍යශාලා මණ්ඩලයට සහ ආයුර්වේද පර්යේෂණ කමිටුවට ගාස්තු අය කිරීමට හැකිවන සේ එකී වගන්තියේ විෂයපථය පුළුල් කිරීම වේ.

***34 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 18 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***35 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 18 වන සහ 51 වන වගන්තිවලට සිදු කරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

***36 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 18 වන සහ 51 වන වගන්තිවලට සිදු කරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ

***37 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියේ විෂයපථය පුළුල් කිරීමෙන් එකී වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***38 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 51 වන වගන්තිය මගින් සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***39 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තියේ විෂයපථය පුළුල් කිරීමෙන් එකී වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***40 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, එම වගන්තියේ සඳහන් වැරදිවලට සහ ව්‍යාතිරේකවලට අදාළ විධිවිධානවල විෂය පථය පුළුල් කිරීම වේ.

***41 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 18 වන වගන්තියට සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***42 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, එකී වගන්තියේ විධිවිධානවල පරාසය විස්තීර කිරීම වේ.

***43 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, එකී වගන්තියේ සඳහන් වරදට අදාළ විධිවිධානවල ක්ෂේත්‍රපථය විස්තීර කිරීම වේ.

***44 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, වැරදි සහ දණ්ඩනවලට අදාළ විධිවිධානවල ක්ෂේත්‍රපථය විස්තීර කිරීම වේ.

***45 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මේ වගන්තියේ විෂයපථය පුළුල් කිරීම වේ.

***46 වන වගන්තිය:*** පවත්නා ඇතැම් අර්ථ නිරූපණ ප්‍රතියෝජනය කිරීමෙන් මෙන්ම අලුත් අර්ථ නිරූපණ හඳුන්වාදීමෙන් මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

# ආයුර්වේද (සංශෝධන)

එල්.ඩී.-ඕ. 39/2022

## 1961 අංක 31 දරන ආයුර්වේද පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2023 අංක      දරන ආයුර්වේද (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1961 අංක 31 දරන පනතේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කිරීම

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ දීර්ඝ නාමය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත සඳහන් දීර්ඝ නාමය ආදේශ කරනු ලැබේ:-

"ආයුර්වේද දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා ද; ආයුර්වේද රෝහල්, ආයුර්වේද ඔසුසල්, ආයුර්වේද බෙහෙත් ශාලා, ආයුර්වේද ගබඩා, ඔසු වගා සහ පර්යේෂණ සහ ව්‍යාපෘතිය සඳහා වන ඔසු උයන් ලියාපදිංචි කිරීම සඳහා ද; ආයුර්වේද වෛද්‍යවරයන්, ආයුර්වේද භෛසජ්ජකයන්, ආයුර්වේද හෙද සේවකයන් සහ ආයුර්වේද සම්බාහන ශිල්පීන් සහ සම්බාහන ශිල්පිනියන් ලියාපදිංචි කිරීමට සහ ඔවුන්ගේ වෘත්තීය පැවැත්මට අදාළ කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස ආයුර්වේද වෛද්‍ය සභාවක් පිහිටුවීම සඳහා ද; ඩිප්ලෝමා, සහතිකපත්, උපාධි සහ පශ්චාත් උපාධි ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් සහ ආයුර්වේද අධ්‍යාපනය සහ පුහුණුව සම්බන්ධයෙන් ඇතැම් කර්තව්‍ය ඉටු කිරීම පිණිස ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලයක් පිහිටුවීම සඳහා ද; ආයුර්වේද ජාතික රෝහල, ආයුර්වේද ශික්ෂණ රෝහල්, ආයුර්වේද පර්යේෂණ රෝහල් සහ ඊට අනුබද්ධ ඔසුසල්, ඖෂධ නිධි සහ බෙහෙත් ශාලාවලට අදාළ කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ද; ආයුර්වේද පර්යේෂණවලට අදාළ ඇතැම් කර්තව්‍ය ඉටු කිරීම සඳහා ද; (106 වන අධිකාරය වූ) දේශීය වෛද්‍ය ආඥාපනත සහ (279 වන අධිකාරය වූ) ආයුර්වේද වෛද්‍ය සභා ආඥාපනත ඉවත් කිරීම පිණිස ද, (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතට, (218 වන අධිකාරය වූ) විෂ වර්ග, අබිං සහ

අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතට සහ (216 වන අධිකාරය වූ) ආහාර සහ ඖෂධ පනතට ආනුෂංගික සංශෝධන කිරීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.".

පොදු සංශෝධන

**3.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක, "ආයුර්වේද කොමසාරිස්", "ආයුර්වේද වෛද්‍ය සභාව", "ආයුර්වේද ආරෝග්‍යශාලා", "ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරය", "ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර", "ආයුර්වේද ඖෂධ ශාලාව", "ආයුර්වේද ඖෂධ ශාලා", "ආයුර්වේද බෙහෙත් ගබඩාව", "ආයුර්වේද බෙහෙත් ගබඩා", "ආයුර්වේද වෛද්‍යවරයන්", "ආයුර්වේද ඖෂධ සංයෝජකයන්", "ආයුර්වේද සාත්තු සේවකයන්", "ආයුර්වේද මධ්‍යම ආරෝග්‍යශාලාව" සහ "ආයුර්වේද පර්යේෂණ කමිටුව" යන වචන වෙනුවට පිළිවෙළින්, "ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා", "ආයුර්වේද වෛද්‍ය සභාව", "ආයුර්වේද රෝහල්", "ආයුර්වේද ඔසුසල", "ආයුර්වේද ඔසුසල්", "ආයුර්වේද බෙහෙත් ශාලාව", "ආයුර්වේද බෙහෙත් ශාලා", "ආයුර්වේද ගබඩාව", "ආයුර්වේද ගබඩා", "ආයුර්වේද වෛද්‍යවරු", "ආයුර්වේද භෛසජ්ජකයන්", "ආයුර්වේද හෙද සේවකයන්", "ආයුර්වේද ජාතික රෝහල" සහ "ආයුර්වේද පර්යේෂණ කමිටුව" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) යම් දැන්වීමක, නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "ආයුර්වේද කොමසාරිස්වරයාට", "ආයුර්වේද වෛද්‍ය සභාවට", "ආයුර්වේද ආරෝග්‍යශාලාවලට", "ආයුර්වේද නිෂ්පාදනාගාරයකට", "ආයුර්වේද නිෂ්පාදනාගාරවලට","ආයුර්වේද ඖෂධශාලාවකට", "ආයුර්වේද ඖෂධශාලාවලට", "ආයුර්වේද බෙහෙත් ගබඩාවකට", "ආයුර්වේද බෙහෙත් ගබඩාවලට", "ආයුර්වේද වෛද්‍යවරුන්ට", "ඖෂධ සංයෝජකයන්ට", "ආයුර්වේද සාත්තු සේවකයන්ට", "ආයුර්වේද මධ්‍යම රෝහලට" සහ "ආයුර්වේද පර්යේෂණ කමිටුවට" කරනු ලබන සෑම සඳහනක් ම පිළිවෙළින්, "ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයාට", "ආයුර්වේද වෛද්‍ය සභාවට", "ආයුර්වේද රෝහල්වලට", "ආයුර්වේද ඔසුසලකට", "ආයුර්වේද ඔසුසල්වලට", "ආයුර්වේද බෙහෙත් ශාලාවකට", "ආයුර්වේද ගබඩාවකට", "ආයුර්වේද ගබඩාවලට", "ආයුර්වේද වෛද්‍යවරුන්ට", "ආයුර්වේද භෛසජ්ජකයන්ට", "ආයුර්වේද හෙද සේවකයන්ට", "ආයුර්වේද ජාතික රෝහලට" සහ "ආයුර්වේද පර්යේෂණ කමිටුවට කරන සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන, 4 වන, 6 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන, 13 වන, 15 වන, 22 වන, 23 වන, 24 වන, 26 වන, 33 වන, 34 වන, 35 වන, 37 වන සහ 75 වන වගන්තිවල "කොමසාරිස්වරයා" යන්නට කරනු ලැබ ඇති සෑම සඳහනක් ම, "ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයාට" කරනු ලබන සඳහනක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුතු ය.

(4) ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ සිට 21 වන වගන්තිය දක්වා ද 42 වන වගන්තිය, 50 වන වගන්තියේ සිට 63 වන වගන්තිය දක්වා ද, 71 වන සහ 81 වන වගන්තිවල ද, "සභාව" යන්නට, වන සෑම සඳහනක් ම "ආයුර්වේද වෛද්‍ය සභාවට" කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස්වරු" යන වචන වෙනුවට, "අතිරේක ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා, ආයුර්වේද කොමසාරිස්වරු, ආයුර්වේද නියෝජ්‍ය කොමසාරිස්වරු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ "නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස්වරු" යන වචන වෙනුවට, "අතිරේක ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා, ආයුර්වේද කොමසාරිස්වරු, නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස්වරු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ "නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස්වරු" යන වචන වෙනුවට, "අතිරේක ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා, ආයුර්වේද කොමසාරිස්වරු, නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස්වරු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:-

"පනතේ අරමුණු

7. පනතේ අරමුණු-

(අ) ආයුර්වේදයට අනුව රෝගවලට ප්‍රතිකාර කිරීම සඳහා අවශ්‍ය ආයතන පිහිටුවීම, සේවා සැපයීම සහ පොදුවේ පුද්ගල සෞඛ්‍ය සංරක්ෂණය සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම;

(ආ) දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත සහ නියුක්ත වීමට යෝජිත පුද්ගලයන්ට ශිෂ්‍යත්ව සහ වෙනත් පහසුකම් සැපයීම මගින් ආයුර්වේදය හැදෑරීම හා පර්යේෂණ කිරීම දිරිමත් කිරීම සහ එවැනි ආයතන සඳහා මූල්‍ය ආධාර ප්‍රදානය කිරීම සහ වෙනත් ආධාර සැපයීම;

(ඇ) ආයුර්වේදයට අනුව රෝග නිර්ණය කිරීම සහ මහජන සෞඛ්‍යය දියුණු කිරීම සඳහා පියවර ගැනීම සහ දිරිගැන්වීම;

(ඈ) 8 වන වගන්තිය යටතේ ස්ථාපනය කරන ලද ඖෂධ නිධි කළමනාකරණය කිරීම;

(ඉ) මහජනතාවගේ යහපැවැත්ම උදෙසා ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාවේ භාවිතයන් කාර්යක්ෂම හා විධිමත් පරිචයන් තුළ පවත්වාගෙන යාම;

(ඊ) ලියාපදිංචි ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයන්ගේ වෘත්තීය කටයුතු සහ ක්‍රියාකාරකම් නියාමනය කිරීම මගින් ඉහළ වෘත්තීය ප්‍රමිති සහතික කිරීම;

(උ) දෙපාර්තමේන්තුව මගින් හෝ තත්කාර්යය සඳහා පනතේ VI වන කොටස යටතේ සංස්ථාපනය කරන ලද මණ්ඩලයක් මගින් 77 වන වගන්තිය යටතේ සඳහන් කරන ලද සංග්‍රහයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම තුළින් ගුණාත්මක ආයුර්වේද භාණ්ඩ, ද්‍රව්‍ය හෝ ඖෂධ ලබා දීම සහ පර්යේෂණ සහ ව්‍යාප්තිය සඳහා වන ඖෂධ උයන් හෝ වගා කළමනාකරණය කිරීම,

විය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් 7අ වගන්තිය ඇතුළත් කිරීම**

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"ඒකාබද්ධ අරමුදලට මුදල් බැර කිරීම සහ ඒකාබද්ධ අරමුදලින් ප්‍රදානය කරන මුදල් උපයෝගී කර ගැනීම

7අ. (1) ඒකාබද්ධ අරමුදලින් වරින් වර ප්‍රදානය කරනු ලබන මුදල්, පනතේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත යුතු ය.

(2) පනතේ නිශ්චිතව දක්වා ඇති අරමුණු ඉටු කිරීමේ දී සහ දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය ඉටු කිරීමේ දී ගාස්තු හෝ වෙනත් යම් ආකාරයකින් ලැබෙන්නා වූ, අයකර ගන්නා වූ හෝ රැස්කරන්නා වූ සියලු මුදල්, ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම**

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ "ආයුර්වේද ආරෝග්‍යශාලා" යන වචන වෙනුවට, "ආයුර්වේද රෝහල්, පර්යේෂණ සහ ව්‍යාප්තිය සඳහා වූ ඔසු උයන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම**

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ "ආයුර්වේද ආරෝග්‍යශාලා" යන වචන දැක්වෙන කවර හෝ තැනක ඒ වෙනුවට "ආයුර්වේද රෝහල්, ඔසු වගා" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම**

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (ආ) ඡේදය වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ආ) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති සහ ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති සහ ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ ප්‍රධානියා සහ ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ ප්‍රධානියා;";

(2) එහි (ඇ) ඡේදය වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඇ) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ, ආයුර්වේද සහ යුනානි අංශ සහ ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ සහ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ, එම එක් එක් ඒකකය හෝ ආයතනය විසින් තෝරා පත් කර ගත් එක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ඇතුළු සාමාජිකයන් පස් දෙනෙකු;";

(3) එහි (ඊ) ඡේදයේ (i) වන අනුඡේදය සඳහා පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(i) ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරු නොවන නීති, පරිපාලන සහ ගිණුම් ක්ෂේත්‍ර නියෝජනය කරන තැනැත්තන් අතරින් පත් කරගනු ලබන තිදෙනෙකුට නොවැඩි තැනැත්තන්; සහ";

(4) එම උපවගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(උ) අවස්ථාවෝචිත පරිදි, මුදල් හෝ භාණ්ඩාගාර විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද පරිදි එක් සාමාජිකයකු.".

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ "සභාවේ එක් එක් සාමාජිකයකු විසින්" යන වචනවල සිට "නැවත පත් කිරීම සඳහා සුදුසු විය යුතු ය" යන වචන දක්වා වන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම

"කොමසාරිස් ජනරාල්වරයා සහ ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති, ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ

දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති සහ ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ ප්‍රධානියා සහ ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ ප්‍රධානියා නොවන සභාවේ එක් එක් සාමාජිකයකු, ඔහු විසින් කලින් ධුරය හිස්කරනු ලබන්නේ නම් මිස, වසර තුනක කාල සීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, නැවත තෝරා පත් කරනු ලැබීමට හෝ නැවත පත් කරනු ලැබීමට සුදුසුකම් ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"සභාවේ සාමාජිකයන් විසින් ධුර හිස් කිරීම

13. (1) කොමසාරිස් ජනරාල්වරයා, ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති, ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය විද්‍යා ඒකකයේ ප්‍රධානියා සහ ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය විද්‍යා ඒකකයේ ප්‍රධානියා නොවන සභාවේ සාමාජිකයකු-

(අ) ඔහු රාජ්‍ය නිලධරයකු නොවන අවස්ථාවක දී, ස්වකීය ඉල්ලා අස්වීම ලිඛිතව සභාවේ සභාපතිවරයාට යැවීමෙන්; සහ

(ආ) ඔහු රාජ්‍ය සේවකයකු නොවන අවස්ථාවක දී, සභාවේ මතය පරිදි ප්‍රමාණවත් හේතු දැක්වීමකින් තොරව සභාවේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණි අවස්ථාවක දී,

ඔහු විසින් ධුරය හිස් කර ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(2) කොමසාරිස් ජනරාල්වරයා, කොමසාරිස් ජනරාල්වරයා ලෙස ඔහුගේ ධුරය දැරීම අවසන් වීමේ දී සභාවේ සාමාජිකයකු ලෙස ධුරය හිස් කර ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(3) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති, ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ ප්‍රධානියා හෝ ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ ප්‍රධානියා, අවස්ථාවෝචිත පරිදි, එකී අදාළ ආයතනයක ප්‍රධානියකු ලෙස ධුර දැරීම අවසන් වීමේ දී සභාවේ සාමාජිකයකු ලෙස ධුරය හිස්කර ඇති බවට සලකනු ලැබිය යුතු ය.".

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ "හයදෙනෙකු විය යුතු ය." යන වචන වෙනුවට, "දහතුන් දෙනෙකු විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඈඅ) ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන් ලෙස තැනැත්තන් ලියාපදිංචි කිරීම;";

(2) එහි (ඉ) ඡේදයේ "ලියාපදිංචි කිරීම; සහ" යන වචන වෙනුවට "ලියාපදිංචි කිරීම;" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (ඊ) ඡේදයේ (i) වන අනුඡේදයේ "සහ ආයුර්වේද සාත්තු සේවකයන්; සහ" යන වචන වෙනුවට "සහ ආයුර්වේද හෙද සේවකයන් සහ ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන්; සහ" යන වචන ආදේශ කිරීමෙන්.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(අඅ) මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ හෝ භාණ්ඩාගාර ලේකම්වරයාගේ නියෝජිතයකු;";

(2) එහි (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ආ) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති, ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ ප්‍රධානියා සහ ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ ප්‍රධානියා;";

(3) එහි (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ආඅ) දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ ප්‍රධානියා;";

(4) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඇ) ආයුර්වේද ජාතික රෝහලේ ප්‍රධානියා;";

(5) එම උපවගන්තියේ (ඈ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඈ) උසස් අධ්‍යාපනය විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් නිලය දරන හෝ ඊට ඉහළ නිලයක් දරන නිලධරයකු;";

(6) එම උපවගන්තියේ (ඉ) ඡේදය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඉ) උසස් අධ්‍යාපනය විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ, ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ සහ ශ්‍රී ලංකාවේ නැගෙනහිර

විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ කථිකාචාර්යවරු අතරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකු;";

(7) එහි (ඊ) ඡේදය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඊ) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ, ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ සහ ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ කථිකාචාර්යවරුන් විසින්, ඔවුන් අතරින්, තෝරාපත් කරගත් (ඉ) ඡේදය යටතේ පත්කළ සාමාජිකයන් නොවන සාමාජිකයන් පස් දෙනෙකු;";

(8) එහි (උ) ඡේදයේ "නොඅඩු සාමාජිකයන්; සහ" යන වචන වෙනුවට "නොඅඩු සාමාජිකයන්;" යන වචන ආදේශ කිරීමෙන් ද;

(9) එහි (ඒ) ඡේදයේ "සාමාජිකයන් දෙදෙනෙකු," යන වචන වෙනුවට "සාමාජිකයන් දෙදෙනෙකු; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(10) එහි (ඒ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඔ) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයාගේ තනතුරට පහළ නොවන තනතුරක එක් සාමාජිකයකු.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ "කොමසාරිස්වරයා, ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විදුහල්පතිවරයා" යන වචනවල සිට

"නැවත පත් කරනු ලැබීමට සුදුසුකම් ලැබිය යුතු යː" දක්වා වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේː-

"කොමසාරිස් ජනරාල්වරයා, ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති, ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ පීඨාධිපති, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ ප්‍රධානියා, ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ ප්‍රධානියා, ආයුර්වේද ජාතික රෝහලේ ප්‍රධානියා හෝ දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ ප්‍රධානියා හැර මණ්ඩලයේ එක් එක් සාමාජිකයකු විසින්, ඒ සාමාජිකයා කලින් ඔහුගේ ධුරය හිස් කර ඇත්නම් මිස, වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, නැවත තෝරා පත් කරගනු ලැබීමට හෝ නැවත පත් කරනු ලැබීමට සුදුසුකම් ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේː-

(1) එහි (1) වන උපවගන්තියේ "කොමසාරිස්වරයා" යන වචන වල සිට "වෛද්‍ය අධිකාරීවරයා" දක්වා වන වචන වෙනුවට, "කොමසාරිස් ජනරාල්වරයා, ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති, ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ පීඨාධිපති, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ සහ ආයුර්වේද ජාතික රෝහලේ ප්‍රධානීන් සහ දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ ප්‍රධානියා" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (3) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්ː-

"(3) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති, ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ

පීඨාධිපති, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ ප්‍රධානියා හෝ ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ ප්‍රධානියා, අවස්ථාවෝචිත පරිදි, ඔහු ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති, ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ පීඨාධිපති, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ ප්‍රධානියා හෝ ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ ප්‍රධානියා ලෙස ධුර දැරීම අවසන් වීමත් සමඟ ම මණ්ඩලයේ සාමාජික ධුරය හිස් කරනු ලැබ ඇති බවට සලකනු ලැබිය යුතු ය.";

(3) එහි (4) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(4) ආයුර්වේද ජාතික රෝහලේ ප්‍රධානියා ඔහු ආයුර්වේද ජාතික රෝහලේ ප්‍රධානියාගේ ධුරය දැරීම අවසන් වීමත් සමඟ මණ්ඩලයේ සාමාජික ධුරය හිස් කරනු ලැබ ඇති බවට සලකනු ලැබිය යුතු ය.".

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ "හය දෙනෙකු විය යුතු ය." යන වචන වෙනුවට "දාහතර දෙනෙකු විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(අ) (i) මේ පනත යටතේ පශ්චාත් උපාධි, මූලික උපාධි, ඩිප්ලෝමා සහ සහතිකපත් ප්‍රදානය සඳහා අවශ්‍ය සුදුසුකම්;

(ii) මේ පනත යටතේ ලියාපදිංචිය සඳහා සලකා බැලිය යුතු වීම පිණිස දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාල හෝ උපාධි ප්‍රදාන ආයතන මගින් පවත්වනු ලබන මූලික උපාධි, ඩිප්ලෝමා සහ සහතිකපත් ප්‍රදානය කරනු ලබන පාඨමාලාවල ප්‍රමිති;

(iii) මේ පනත යටතේ ලියාපදිංචිය සඳහා සලකා බැලිය යුතු වීම පිණිස, දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාල හෝ උපාධි ප්‍රදාන ආයතන මගින් පිරිනමන මූලික උපාධි, ඩිප්ලෝමා සහ සහතිකපත් දරන්නන් සඳහා විභාග පැවැත්වීම; සහ

(iv) මේ පනත යටතේ ලියාපදිංචි වීම සඳහා සලකා බැලිය යුතු වීම පිණිස දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලවලින් හෝ උපාධි ප්‍රදාන ආයතනවලින් පිරිනමන මූලික උපාධි, ඩිප්ලෝමා සහ සහතිකපත් දරන්නන්ට නියම කරනු ලබන සීමාවාසික පුහුණු වීම් හෝ පුහුණුවීම්වල ප්‍රමිති සහ කාලසීමා,

නිශ්චය කිරීමට;";

(2) එහි (ආ) ඡේදයේ "අභිඥාන පත්‍ර හෝ සහතික ලබා ගැනීමට තැනැත්තන්ට" යන වචන වෙනුවට "පශ්චාත් උපාධි හෝ මූලික උපාධි ලබාගැනීමට තැනැත්තන්ට" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (ඇ) ඡේදයේ "අභිඥාන පත්‍ර හෝ සහතික ලබා ගැනීමට තැනැත්තන්ට" යන වචන වෙනුවට "පශ්චාත් උපාධි හෝ මූලික උපාධි ලබාගැනීමට තැනැත්තන්ට", යන වචන ආදේශ කිරීමෙන්.

(4) එහි (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඇඇ) මේ පනත යටතේ පශ්චාත් උපාධි, මූලික උපාධි, ඩිප්ලෝමා සහ සහතික පත්‍ර ප්‍රදානය සඳහා අවශ්‍ය අවස්ථාවල දී නියම කරනු ලැබිය යුතු යම් ගාස්තු පිළිබඳව අමාත්‍යවරයාට නිර්දේශ කිරීමට;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (1) වන උපවගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ:-

"(1) (මෙහි මින් මතු මේ කොටසේ "කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන) ආයුර්වේද පර්යේෂණ කමිටුව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු, පහත සඳහන් සාමාජිකයන්, එනම්-

(අ) කොමසාරිස් ජනරාල්වරයා;

(ආ) ආයුර්වේද ජාතික රෝහලේ ප්‍රධානියා;

(ඇ) බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනයේ ප්‍රධානියා;

(ඈ) කොළඹ විශ්වවිද්‍යාලය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය, නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකය යන එක් එක් විශ්වවිද්‍යාල නියෝජනය කරන මහාචාර්යවරු සිව් දෙනෙකු;

(ඉ) 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත යටතේ පිහිටුවන ලද ජාතික විද්‍යා පදනම විසින් යථා පරිදි පත් කළ එක් සාමාජිකයකු;

(ඊ) 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය මගින් යථා පරිදි පත් කළ එක් සාමාජිකයකු;

(උ) විද්‍යාව විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කළ එක් සාමාජිකයකු;

(ඌ) නීති ක්ෂේත්‍රයේ වසර දහයක් හෝ ඊට වැඩි පළපුරුද්දක් දරන තැනැත්තන් අතරින් අමාත්‍යවරයා විසින් පත් කළ එක් සාමාජිකයකු; සහ

(එ) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් නිලයට අඩු නොවන නිලයක සාමාජිකයකු,

යන සාමාජිකයන් දොළොස් දෙනෙකුගෙන් සමන්විත විය යුතු කමිටුවක් තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ "තුන්දෙනෙකු විය යුතු ය" යන වචන වෙනුවට "පස් දෙනෙකු විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "ආයුර්වේද සායනික ප්‍රතිකාර;" යන වචන වෙනුවට "ආයුර්වේද සායනික ප්‍රතිකාර සහ ආයුර්වේද ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණ," යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඇඇ) (අ) සිට (ඇ) ඡේදවල සඳහන් කාරණා සම්බන්ධයෙන් නියම කරන ලද යම් ගාස්තුවක් අය කිරීම;";

(3) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(3) (1) වන සහ (2) වන උපවගන්තිවල නිශ්චිතව දක්වා ඇති කාර්ය සහ වගකීම් ඉටු කිරීමට අනුකමිටු හෝ උපකමිටු එකක් හෝ ඊට වැඩිගණනක් ඇති කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ-

(අ) (අ) ඡේදයේ "සහ විශේෂ නාමලේඛනයක්" යන වචන වෙනුවට "සහ විශේෂ නාමලේඛනයක් සහ කායික රෝග විශේෂඥවරුන්ගේ නාමලේඛනයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය අලුතින් එකතු කිරීමෙන්:-

"(ඈ) ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ ශිල්පිනියන් ලියාපදිංචි කිරීම සඳහා වන ලේඛනයක්.";

(2) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(3) විශේෂඥ වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා මේ පනත යටතේ සභාව විසින් පවත්වාගෙන යනු ලබන කායික විශේෂඥ වෛද්‍යවරුන්ගේ නාමලේඛනයක් පැවතිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "සාමාන්‍ය නාමලේඛනයේ හෝ විශේෂ නාමලේඛනයේ" යන වචන වෙනුවට "සාමාන්‍ය නාමලේඛනයේ හෝ විශේෂ නාමලේඛනයේ හෝ විශේෂඥ වෛද්‍යවරුන්ගේ නාමලේඛනයේ" යන වචන ආදේශ කිරීමෙන්,

(2) එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(3අ) විශේෂඥ වෛද්‍යවරුන්ගේ නාමලේඛනයේ විශේෂඥ වෛද්‍යවරයකු ලෙස ලියාපදිංචි වීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක්-

(අ) 55 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම්කරු ඒ ලියාපදිංචිය සඳහා හිමිකම් නොලබන හේතු මත හැර; හෝ

(ආ) 57 වන වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් හේතුවක් මත හැර,

සභාව විසින් ප්‍රතික්ෂේප නොකළ යුතු ය."; සහ

(3) එහි (4) වන උපවගන්තියේ "සාමාන්‍ය නාමලේඛනයේ සහ විශේෂ නාමලේඛනයේ යන දෙකෙහි ම" යන වචන වෙනුවට "සාමාන්‍ය නාමලේඛනයේ, විශේෂ නාමලේඛනයේ සහ විශේෂඥ වෛද්‍යවරුන්ගේ නාමලේඛනයේ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තියේ "ආයුර්වේද ඖෂධ සංයෝජකවරු හෝ ආයුර්වේද සාත්තු සේවකයන්" යන වචන ඒ වගන්තියේ දැක්වෙන සෑම තැනක දී ම, ඒ වචන වෙනුවට "ආයුර්වේද හෛසජ්ජකයන්, ආයුර්වේද හෙද සේවකයන් හෝ ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ "ආයුර්වේද ඖෂධ සංයෝජකවරු හෝ ආයුර්වේද සාත්තු සේවකයන්" යන වචන ඒ වගන්තියේ දැක්වෙන සෑම තැනක දී ම, ඒ වචන වෙනුවට, "ආයුර්වේද හෛසජ්ජකයන්, ආයුර්වේද හෙද සේවකයන් හෝ ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ ශිල්පිනියන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ ආයුර්වේද ආයතනය" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකය, ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකය හෝ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"ආයුර්වේද හෛසජ්ජකයන්, ආයුර්වේද හෙද සේවකයන් හෝ ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ ශිල්පිනියන් ලෙස ලියාපදිංචි කරනු ලැබීම සඳහා සුදුසුකම්

56. යම් තැනැත්තකු-

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වේ නම්; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා කාර්යක්ෂමව ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීමේ විද්‍යාවේ ප්‍රමාණවත් දැනුමක්, පළපුරුද්දක් සහ හැකියාවක් ඇත්නම් හෝ ආයුර්වේද හෙද සේවයේ ප්‍රමාණවත් පළපුරුද්දක් ඇත්නම් හෝ

ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ ශිල්පිනියන් ලෙස වෘත්තීය නිපුණතාවක් ඇත්නම්,

මිස කිසිදු තැනැත්තකු, ආයුර්වේද භෛසජ්ජකයකු, ආයුර්වේද හෙද සේවකයකු හෝ ආයුර්වේද සම්බාහන ශිල්පියකු හෝ ශිල්පිනියක ලෙස ලියාපදිංචි වීමට හිමිකම් නොදරන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය සංශෝධනය කිරීම

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ-

(අ) (අ) ඡේදයේ, "ඖෂධ සංයෝජකවරු, ආයුර්වේද සාත්තුසේවකයන්" යන වචන වෙනුවට, "භෛසජ්ජකයන්, ආයුර්වේද හෙද සේවකයන්, ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන්" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ආ) ඡේදයේ, "ඖෂධ සංයෝජකවරයකු, ආයුර්වේද සාත්තුසේවකයන්" යන වචන වෙනුවට, "භෛසජ්ජකයන්, ආයුර්වේද හෙද සේවකයන්, ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන්" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) (ඇ) ඡේදයේ "යම් ඩිප්ලෝමා හෝ සහතිකයක්" යන වචන වෙනුවට "යම් පශ්චාත් උපාධියක් හෝ මූලික උපාධියක් හෝ ඩිප්ලෝමාවක් හෝ සහතිකයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියේ "ආයුර්වේද ඖෂධ සංයෝජකයන් හෝ ආයුර්වේද සාත්තුසේවකයන්" යන වචන දැක්වෙන සෑම තැනක ම, ඒ වෙනුවට, "ආයුර්වේද භෛසජ්ජකයන් හෝ ආයුර්වේද හෙද සේවකයන් හෝ ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන්" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (3) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(3) යම් තැනැත්තකු සාමාන්‍ය නාමලේඛනය සහ විශේෂඥ වෛද්‍යවරුන්ගේ නාමලේඛනය යන

නාමලේඛන දෙකෙහි ම ආයුර්වේද වෛද්‍යවරයකු ලෙස ලියාපදිංචි වී ඇති අවස්ථාවක දී, ඔහුගේ ලියාපදිංචිය සාමාන්‍ය නාමලේඛනයේ අවලංගු කර ඇත්තේ නම්, සභාව විසින්, නියෝගයක් මගින්, විශේෂඥ වෛද්‍යවරුන්ගේ නාමලේඛනයේ ඔහුගේ ලියාපදිංචිය අවලංගු කළ යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තියේ "ආයුර්වේද ඖෂධ සංයෝජකයන් හෝ ආයුර්වේද සාත්තුසේවකයන්" යන වචන දැක්වෙන සෑම තැනක ම, ඒ වෙනුවට, "ආයුර්වේද භෛසජ්ජකයන් හෝ ආයුර්වේද හෙද සේවකයන් හෝ ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය සංශෝධනය කිරීම

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "ආයුර්වේද ඖෂධ සංයෝජක හෝ ආයුර්වේද සාත්තුසේවක" යන වචන වෙනුවට සහ "ආයුර්වේද සාත්තු සේවක නාමලේඛනය" යන වචන වෙනුවට, පිළිවෙළින් "ආයුර්වේද භෛසජ්ජක, ආයුර්වේද හෙද සේවක හෝ ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන්" යන වචන සහ "ආයුර්වේද හෙද සේවක නාමලේඛනය, ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන්ගේ නාමලේඛනය" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියේ, "ආයුර්වේද ඖෂධ සංයෝජක හෝ ආයුර්වේද සාත්තුසේවක" යන වචන වෙනුවට සහ "ආයුර්වේද සාත්තුසේවකයන්ගේ නාමලේඛනය" යන වචන වෙනුවට පිළිවෙළින්, "ආයුර්වේද භෛසජ්ජක හෝ ආයුර්වේද හෙද සේවක හෝ ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන්" යන වචන සහ "ආයුර්වේද හෙද සේවකයන්ගේ නාමලේඛනය, ආයුර්වේද සම්බාහන ශිල්පීන්ගේ හෝ ශිල්පිනියන්ගේ නාමලේඛනය" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (3) වන උපවගන්තියේ, "ආයුර්වේද ඖෂධ සංයෝජක හෝ ආයුර්වේද සාත්තුසේවක" යන වචන සහ "ආයුර්වේද සාත්තු සේවකයන්ගේ නාමලේඛනය" වෙනුවට පිළිවෙළින්

"ආයුර්වේද හෛසජ්ජකයන් හෝ ආයුර්වේද හෙද සේවකයන් හෝ ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන්" යන වචන සහ "ආයුර්වේද හෙද සේවකයන්ගේ නාමලේඛනය, ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන්ගේ නාමලේඛනය" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"18 වන වගන්තියේ කාර්යය සඳහා සහ 30 වන වගන්තිය යටතේ වන නිලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ 41 වන වගන්තිය යටතේ වන කාර්ය ඉටු කිරීමේ දී අය කරනු ලබන ගාස්තු

60. (1) ආයුර්වේද වෛද්‍යවරයකු, ආයුර්වේද හෛසජ්ජකවරයකු, ආයුර්වේද හෙද සේවකයකු හෝ ආයුර්වේද සම්බාහන ශිල්පියකු හෝ සම්බාහන ශිල්පිනියක ලෙස ලියාපදිංචි වීමේ ගාස්තුව මෙම පනත යටතේ සභාව විසින් රීති මගින් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයක් විය යුතු ය.

(2) යම් තැනැත්තකු, අවස්ථාවෝචිත පරිදි, ආයුර්වේද වෛද්‍යවරයකු, ආයුර්වේද හෛසජ්ජකවරයකු, ආයුර්වේද හෙද සේවකයකු, ආයුර්වේද සම්බාහන ශිල්පියකු හෝ සම්බාහන ශිල්පිනියක ලෙස ලියාපදිංචි වීම සඳහා වන ගාස්තුව ගෙවනු ලබන තෙක් ලේඛකාධිකාරීවරයා විසින් එකී තැනැත්තාගේ නම ආයුර්වේද වෛද්‍යවරුන්ගේ නාමලේඛනයට, ආයුර්වේද හෛසජ්ජකවරුන්ගේ නාමලේඛනයට, ආයුර්වේද හෙද සේවකයන්ගේ හෝ ආයුර්වේද සම්බාහන ශිල්පීන්ගේ හෝ සම්බාහන ශිල්පිනියන්ගේ නාමලේඛනයේ ලියාපදිංචි නොකළ යුතු ය.

(3) මේ පනතේ 30 වන වගන්තිය යටතේ බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීමේ දී ආයුර්වේද අධ්‍යාපන සහ ආරෝග්‍යශාලා මණ්ඩලය විසින් අය කරනු ලැබිය හැකි ගාස්තු නියෝග මගින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(4) මේ පනතේ 41 වන වගන්තිය යටතේ කාර්ය ඉටු කිරීමේ දී ආයුර්වේද පර්යේෂණ කමිටුව විසින් අය කරනු ලැබිය හැකි ගාස්තු නියෝග මගින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තියේ "ආයුර්වේද ඖෂධ සංයෝජක හෝ ආයුර්වේද සාත්තුසේවක" යන වචන වෙනුවට පිළිවෙළින් "ආයුර්වේද භෛසජ්ජක හෝ ආයුර්වේද හෙද සේවක හෝ ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය සංශෝධනය කිරීම

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තියේ "ආයුර්වේද සාත්තුසේවක නාමලේඛනය" සහ "ආයුර්වේද ඖෂධ සංයෝජක හෝ ආයුර්වේද සාත්තුසේවක" යන වචන වෙනුවට පිළිවෙළින් "ආයුර්වේද හෙද සේවක නාමලේඛනය, ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන්ගේ නාමලේඛනය" යන වචන සහ "ආයුර්වේද භෛසජ්ජක හෝ ආයුර්වේද හෙද සේවක හෝ ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කිරීම

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ, "ආයුර්වේද ඖෂධ සංයෝජක හෝ ආයුර්වේද සාත්තුසේවක" යන වචන වෙනුවට "ආයුර්වේද භෛසජ්ජක හෝ ආයුර්වේද හෙද සේවක හෝ ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (3) වන උපවගන්තියේ, "ආයුර්වේද ඖෂධ සංයෝජක හෝ ආයුර්වේද සාත්තුසේවක" යන වචන සහ "ආයුර්වේද සාත්තුසේවක නාමලේඛනය" යන වචන වෙනුවට පිළිවෙළින් "ආයුර්වේද භෛසජ්ජක හෝ ආයුර්වේද හෙද සේවක හෝ ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන්" යන වචන සහ "ආයුර්වේද හෙද සේවක නාමලේඛනය, ආයුර්වේද සම්බාහන ශිල්පීන්ගේ හෝ සම්භාහන ශිල්පිනියන්ගේ නාමලේඛනය" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"ආයුර්වේද හෛසජ්ජක, ආයුර්වේද හෙද සේවක හෝ ආයුර්වේද සම්බාහන ශිල්පියා හෝ සම්බාහන ශිල්පිනිය නිසි සුදුසුකම්ලත් අය ලෙස සැලකිය යුතු බව

66. යම් ලිඛිත නීතියක කාර්ය සඳහා ලියාපදිංචි ආයුර්වේද හෛසජ්ජක, ආයුර්වේද හෙද සේවකයන් හෝ ආයුර්වේද සම්බාහකවරු හෝ සම්බාහකවරියන්, නීත්‍යානුකූලව හෝ නිසි සුදුසුකම්ලත් පිළිවෙළින් ආයුර්වේද හෛසජ්ජකවරුන්, ආයුර්වේද හෙද සේවකයන් හෝ ආයුර්වේද සම්බාහකවරු හෝ සම්බාහකවරියන් ලෙස සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තිය සංශෝධනය කිරීම

**38.** ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "ආයුර්වේද වෛද්‍යවරුන්ගේ විශේෂ නාමලේඛනයේ" යන වචන වෙනුවට "ආයුර්වේද වෛද්‍යවරුන්ගේ විශේෂ නාමලේඛනයේ හෝ ආයුර්වේද විශේෂඥ වෛද්‍යවරුන්ගේ නාමලේඛනයේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**39.** ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"ලියාපදිංචි ආයුර්වේද හෛසජ්ජකයන්, ලියාපදිංචි ආයුර්වේද හෙද සේවකයන් හෝ ලියාපදිංචි ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන් නිෂ්පාදන කටයුතුවල යෙදීමට හෝ වෘත්තියෙහි නියැලීමට හිමිකම් ලබන බව

70. (1) සෑම ලියාපදිංචි ආයුර්වේද හෛසජ්ජකයකුට ම ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීමට හිමිකම ලැබිය යුතු ය.

(2) සෑම ලියාපදිංචි ආයුර්වේද හෙද සේවකයකුට ම ආයුර්වේද හෙද සේවාවල නියැලීමට හිමිකම් ලැබිය යුතු ය.

(3) සෑම ලියාපදිංචි ආයුර්වේද සම්බාහන ශිල්පියකුම හෝ සම්බාහන ශිල්පිනියකම ආයුර්වේද සම්බාහන ක්‍රමවේදවල නියැලීමට හිමිකම් ලැබිය යුතු ය.".

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තියේ, "ලියාපදිංචි ආයුර්වේද සාත්තුසේවකයන්" යන වචන දැක්වෙන සෑම තැනක ම, ඒ වෙනුවට, "ලියාපදිංචි ආයුර්වේද හෙද සේවකයන් හෝ ලියාපදිංචි ආයුර්වේද සම්බාහන ශිල්පියකු හෝ සම්බාහන ශිල්පිනියක" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(2) 10 වන වගන්තිය යටතේ, ලියාපදිංචි ආයුර්වේද රෝහලක, ඔසු වගාවක, ආයුර්වේද ඔසුසලක, ඖෂධ නිධියක, ආයුර්වේද අලෙවි මධ්‍යස්ථානයක හෝ ආයුර්වේද ගබඩාවක හිමිකරුවකු ලෙස ලියාපදිංචි තැනැත්තකු විසින් ඔහු ලියාපදිංචි ආයුර්වේද භෛසජ්ජකයකු නොවන්නේය යන්න නොසලකා, ඒ ආයුර්වේද රෝහලේ, ඔසු වගාවේ, ඔසු සලේ, ඖෂධ නිධියේ, ආයුර්වේද අලෙවි මධ්‍යස්ථානයේ හෝ ගබඩාවේ ව්‍යාපාරික කාර්යයක් සඳහා-

(අ) ඔහු විසින්, අවස්ථාවෝචිත පරිදි, එවැනි යම් ආයුර්වේද රෝහලක, ඔසු වගාවක, ආයුර්වේද ඔසු සලක, ඖෂධ නිධියක, ආයුර්වේද අලෙවි මධ්‍යස්ථානයක හෝ ආයුර්වේද ගබඩාවක, අවස්ථාවෝචිත පරිදි, බෙහෙත්, ඖෂධ හෝ විෂ වර්ග වගා කිරීම, බෙදා හැරීම, අලෙවිය හෝ නිෂ්පාදනය පුද්ගලිකව ම අධීක්ෂණය සහ කළමනාකරණයට ලියාපදිංචි ආයුර්වේද භෛසජ්ජකයකු සේවයෙහි නියුක්ත කරන්නේ නම්; සහ

(ආ) එසේ සේවා නියුක්ත භෛසජ්ජකයාගේ නම ලිඛිතව සභාවට දැනුම් දෙනු ලැබ ඇත්නම්,

ලියාපදිංචි භෛසජ්ජකයකු විසින් භාවිත කරනු ලැබිය හැකි යම් නමක්, නාමයක් එකතු කිරීමක් හෝ විස්තරයක් එකී ආයුර්වේද රෝහල, ඔසු වගාව, ඔසුසල, ඖෂධ නිධිය, ආයුර්වේද අලෙවි මධ්‍යස්ථානය හෝ ගබඩාව සඳහා භාවිත කළ හැකි ය.".

**41.** ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය එම වගන්තියේ "ආයුර්වේද ඖෂධ සංයෝජකයකු හෝ ආයුර්වේද සාත්තු සේවකයකු" යන වචන වෙනුවට "ආයුර්වේද භෛසජ්ජකයකු හෝ ආයුර්වේද හෙද සේවකයකු හෝ ආයුර්වේද සම්බාහන ශිල්පියකු හෝ සම්බාහන ශිල්පිනියක" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කිරීම

**42.** ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්-

"(1) ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ හා ශල්‍ය වෛද්‍ය විද්‍යාවේ කාර්යය උදෙසා යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් නිෂ්පාදනය, සැකසීම, ආනයනය කිරීම, අපනයනය කිරීම, මිල දී ගැනීම, ගබඩා කිරීම, ප්‍රචාරණය, ප්‍රවාහනය, තත්ත්ව පාලනය, විකිණීම, සැපයීම, බෙදා හැරීම හෝ සංයෝජනය තහනම් කිරීමට, නියාමනය කිරීමට හෝ පාලනය කිරීමට අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් නියෝග සෑදීම සඳහා බලය ඇති අධිකාරිය වශයෙන් අවශ්‍ය විය හැකි බවට සලකනු ලබන සියලු විධිවිධාන අන්තර්ගත වූ ආයුර්වේද සංග්‍රහයක් නියම කරමින් මේ පනත යටතේ නියෝග සෑදිය හැකි ය. පෙර කී බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි, එකී සංග්‍රහය මගින් පහත කාරණා එකක් හෝ සියල්ල සම්බන්ධයෙන් නියෝග සෑදිය හැකි ය:-

(අ) එකී කාර්යය සඳහා යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් අවස්ථාවෝචිත පරිදි, විෂ වර්ගයක්, විෂ සහිත ද්‍රව්‍යයක් හෝ අන්තරායදායක ද්‍රව්‍යයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම;

(ආ) යම් ආයුර්වේද නිෂ්පාදනයක් නිෂ්පාදනය කිරීම, සැකසීම, ආනයනය කිරීම, අපනයනය කිරීම, මිල දී ගැනීම, ගබඩා කිරීම, ප්‍රචාරණය කිරීම, ප්‍රවාහනය කිරීම, තත්ත්ව පාලනය කිරීම, විකිණීම, සැපයීම හෝ බෙදා හැරීම තහනම් කිරීම, නියාමනය කිරීම හෝ පාලනය කිරීම;

(ඇ) පර්යේෂණ හා ව්‍යාප්තිය සඳහා යම් ඖෂධ උයන් ලියාපදිංචි කිරීම සහ පවත්වාගෙන යාම;

(ඈ) ප්‍රවාහනය සහ අස්වැන්න ගබඩා කිරීම ඇතුළුව යම් ඖෂධ වගා සඳහා සම්බන්ධිත යම් ක්‍රියාකාරකම් ද ලියාපදිංචි කිරීම හෝ බලපත්‍ර හෝ අවසර පත්‍ර නිකුත් කිරීම;

(ඉ) යම් ලියාපදිංචි කිරීමක්, බලපත්‍ර හෝ අවසර පත්‍ර නිකුත් කිරීමක් නියාමනය කිරීම හෝ පාලනය බලාත්මක කිරීමේ කාර්යය උදෙසා ඒවා ලියාපදිංචි කිරීම, බලපත්‍ර හෝ අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා ඉල්ලීම් කිරීම, ලියාපදිංචිය, බලපත්‍ර හෝ අවසර පත්‍ර ආදිය අත්හිටුවීම හෝ අවලංගු කිරීම ද ඇතුළුව, එහෙත් ඒ කාරණා සඳහා සීමාවීමෙන් තොරව, ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර හෝ අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දීම සහ එය මෙහෙය වීම;

(ඊ) එවැනි ඖෂධ වගාවල දී සහ එවැනි නිෂ්පාදන කිරීම්, සැකසීම්, ආනයනය කිරීම්, අපනයනය කිරීම්, මිල දී ගැනීම්, ගබඩා කිරීම්, ප්‍රචාරණය කිරීම්, ප්‍රවාහනය කිරීම්, තත්ත්ව පාලනය කිරීම්, විකිණීම්, සැපයීම්, බෙදා හැරීම් සහ සංයෝජනය කිරීම්වල දී ගතයුතු පූර්වාරක්ෂක පියවර ගැනීම සහ අනුගමනය කළ යුතු කොන්දේසි අනුගමනය කිරීම;

(උ) එවැනි ඖෂධ වගා සහ එවැනි නිෂ්පාදන, සැකසීම් ආනයනය කිරීම්, අපනයනය කිරීම්, මිල දී ගැනීම්, ගබඩා කිරීම්, ප්‍රචාරණය කිරීම්, ප්‍රවාහනය කිරීම්, තත්ත්ව පාලනය කිරීම්, බෙදා හැරීම් සහ සංයෝජනය කිරීම්වල නිරතව සිටින තැනැත්තන් විසින් පොත් හා වාර්තා තබා ගැනීම සහ පවත්වා ගෙන යාම;

(ඌ) එවැනි ඖෂධ වගා සහ එවැනි නිෂ්පාදනය කිරීම්, සැකසීම්, ආනයනය කිරීම්, අපනයනය කිරීම්, මිල දී ගැනීම්, විකිණීම්, ප්‍රචාරණය කිරීම්, ප්‍රවාහනය කිරීම්,

තත්ත්ව පාලනය කිරීම්, සැපයීම්, බෙදා හැරීම්, සංයෝජනය කිරීම් සිදු කරන පරිශ්‍රයන් සහ ඒ කාර්ය සඳහා පවත්වාගෙන යන වාර්තා හා පොත් පරීක්ෂා කිරීම;

(එ) මේ වගන්තියේ සඳහන් යම් කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය විට දී ගාස්තු අයකිරීම;

(ඒ) ඉහත කී කාරණා හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වෙනත් යම් කාරණා.";

(2) එහි (2) වන උපවගන්තියේ "අග්‍රාමාත්‍යවරයා" යන වචන වෙනුවට "ජනාධිපතිවරයා" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය සංශෝධනය කිරීම

**43.** ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තියේ, "ලියාපදිංචි ආයුර්වේද ආරෝග්‍යශාලාවක්, යම් ලියාපදිංචි ආයුර්වේද ඔසුසලක්" යන වචන දැක්වෙන සෑම තැනක ම, ඒ වෙනුවට, "ලියාපදිංචි ආයුර්වේද රෝහලක්, යම් ලියාපදිංචි ආයුර්වේද ඔසුසලක්, යම් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක්, යම් ඔසු වගාවක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**44.** ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"වැරදි සහ දණ්ඩන

80. (1) යම් තැනැත්තකු-

(අ) මේ පනත මගින් හෝ මේ පනත යටතේ බලයලත් තැනැත්තකු වෙත පවරන ලද යම් බලතල ඒ තැනැත්තා විසින් ක්‍රියාත්මක කිරීමේ දී මේ පනත යටතේ තත්කාර්ය සඳහා බලය දෙන ලද ඒ තැනැත්තාට විරෝධය පාන්නේ නම් හෝ බාධා කරන්නේ නම්;

(ආ) මේ පනත යටතේ නිකුත් කරනු ලබන දැන්වීමක නියමයන්ට ප්‍රමාණවත් සාධාරණ හේතු නොමැතිව අනුකූල වීමට අපොහොසත් වන්නේ නම්;

(ඇ) මේ පනත යටතේ ඒ තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලබන යම් වාර්තාවක හෝ තොරතුරක යම් සාවද්‍ය ප්‍රකාශයක් හිතාමතාම ඉදිරිපත් කරන්නේ නම්; හෝ

(ඈ) ඉදිරිපත් කිරීමට නියම කළ යම් තොරතුරු සම්බන්ධයෙන් මේ පනත යටතේ ඉදිරිපත් කරනු ලබන යම් වාර්තාවක හෝ තොරතුරක යම් වැදගත් කරුණක් හිතාමතාම පැහැර හරින්නේ නම්,

ඒ තැනැත්තා මේ පනත යටතේ වරදක් සිදුකරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර එකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක අධිකාරය යටතේ ආයුර්වේදයේ නියැලී සිටිය දී මහජන සෞඛ්‍යයට හානි කරන යම් ක්‍රියාවක් සිදුකරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදුකරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(3) පනතේ 79 වන වගන්තිය යටතේ වරදක් සිදු කරන යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ දෙකකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක්

සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(4) යම් තැනැත්තකු-

(අ) මේ පනත යටතේ බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් අවශ්‍ය වන්නා වූ යම් ක්‍රියාවක් බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නොමැතිව කරගෙන යන්නේ නම්;

(ආ) මේ පනත යටතේ නිකුත් කළ වලංගු බලපත්‍රයක් යම් ආයතනයකට, පරිශ්‍රයකට, භාණ්ඩයකට, ද්‍රව්‍යයකට, ඖෂධයකට හෝ ආයුර්වේද නිෂ්පාදනයකට තිබෙන බවට හඟවමින් යම් ලාංඡනයක් හෝ සලකුණක් හෝ සංකේතයක් සාවද්‍ය ලෙස ප්‍රදර්ශනය කරන්නේ නම්,

එකී තැනැත්තා, මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(5) ((1) වන, (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල සඳහන් විධිවිධාන හැර) මේ පනතේ යම් විධිවිධානයක් හෝ එවැනි යම් විධිවිධානයක් යටතේ පනවන ලද යම් නියමයක් හෝ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය වන සේ ක්‍රියා කරන යම් තැනැත්තකු මේ පනත යටතේ

වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කිරීමේ දී-

(i) ඒ තැනැත්තා සංස්ථාපිත මණ්ඩලයක් නොවන අවස්ථාවක, පළමු වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් පන් දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ වසරකට නොවැඩි කාලසීමාවක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු අතර, ඉන් පසුව සිදු කරන වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දණ්ඩනය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම; සහ

(ii) ඒ තැනැත්තා සංස්ථාපිත මණ්ඩලයක් වන අවස්ථාවක පළමු වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් පනස් දහසකට නොඅඩු සහ රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට සහ ඉන් පසුව සිදු කරන වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් ලක්ෂකට නොඅඩු සහ රුපියල් මිලියන දෙකකට නොවැඩි දඩයකට,

යටත් විය යුතු ය.".

**45.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තියේ "ඖසුසල්වලට හෝ සාත්තු සේවයට" යන වචන වෙනුවට "ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයට, හෙද සේවයට හෝ ආයුර්වේද සම්බාහන ක්‍රමවලට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම

**46.** ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) "ආයුර්වේද" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"ආයුර්වේද" යන්නට, ආයුර්වේද සිද්ධ යුනානි සහ යෝග සහ දේශීය චිකිත්සා ඖෂධ ප්‍රතිකාර ක්‍රම සහ ශල්‍යකර්ම වෙනත් යම් ආසියාතික රටවලට ආවේණික හා ඒ අදාළ රටවල රජයන් විසින් පිළිගත් වෙනත් යම් වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම ද ඇතුළත් වන අතර, "ආයුර්වේදීය" යන යෙදුම ඒ අනුව තේරුම්ගනු ලැබිය යුතු ය;

(2) "ආයුර්වේද" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"ආයුර්වේද විශේෂඥ වෛද්‍ය" යන්නෙන්, මේ පනත යටතේ "ආයුර්වේද විශේෂඥ වෛද්‍යවරයකු" ලෙස ලියාපදිංචි වූ තැනැත්තකු අදහස් වේ;

(3) "ආයුර්වේද ඔසුසල" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"ආයුර්වේද නිෂ්පාදනය" යන්නෙන්, නිෂ්පාදනය කරන ලද හෝ විකිණීම සඳහා පිරිපහදු කළ යම් ආයුර්වේද භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් අදහස් වන අතර, එයට දේශීයව නිෂ්පාදනය කරන ලද හෝ ආනයනය කරන ලද ඖෂධීය සාරය හෝ කොටසක්, සෞඛ්‍ය අතිරේකයක්, ආහාර අතිරේකයක්, රූපලාවන්‍ය ද්‍රව්‍යයක් හෝ උපාංගයක් ද ඇතුළත් වේ;

(4) "ආයුර්වේද ඖෂධ ශාලා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලදුව 1986 සැප්තැම්බර් මස 26 වන දින

අංක 420/25 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය අදහස් වේ;

"ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨය" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ සාදන ලදුව 2023 පෙබරවාරි මස 13 වන දින අංක 2319/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨය අදහස් වේ;

"ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ සාදන ලදුව 2020 ඔක්තෝබර් මස 28 වන දින අංක 2197/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය අදහස් වේ;

"ඔසු වගාව" යන්නෙන්, මහා පරිමාණයෙන් ඖෂධ වගා කිරීමේ ක්‍රියාව අදහස් වන අතර, වාණිජමය වටිනාකමකින් යුතු එවැනි වගාවක එලදාව අස්වැන්න හෝ අවශේෂ ද අයත් වේ;

"පර්යේෂණ සහ ව්‍යාප්තිය සඳහා වූ ඔසු උයන්" යන්නෙන්, ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් හෝ ඒ සඳහා මේ පනත යටතේ ලියාපදිංචි තැනැත්තකු විසින් පර්යේෂණ කාර්ය සඳහා ඖෂධීය ශාක වගා කිරීම පිණිස වෙන් කළ වෙන් වූ ඉඩක් අදහස් වේ;

(5) "දේශීය වෛද්‍ය රෝහල" යන යෙදුමේ අර්ථනිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

"ඖෂධීය පැළෑටි" යන්නෙන්, චිකිත්සක කාර්යයන් සඳහා භාවිත කළ හැකි හෝ ප්‍රයෝජනවත් ඖෂධ සංස්ලේෂණය සඳහා පුරෝගාමී වන්නා වූ ද්‍රව්‍ය, ශාකයේ යම් කොටසක හෝ කොටස්වල අඩංගු ශාකයක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන සහ 45 වන ව්‍යවස්ථා යටතේ ආයුර්වේද විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;

(6) "ආයුර්වේද වෛද්‍යවරුන්ගේ නාමලේඛනය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"ආයුර්වේද වෛද්‍යවරුන්ගේ නාමලේඛනය" යන්නෙන්, ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා මේ පනත යටතේ ආයුර්වේද වෛද්‍ය සභාව විසින් පවත්වාගෙන යන සාමාන්‍ය නාමලේඛනයක් හෝ විශේෂ නාම ලේඛනයක් හෝ විශේෂඥ වෛද්‍ය නාම ලේඛනයක් අදහස් වන අතර, 51 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සාමාන්‍ය නාමලේඛනයක්, ආයුර්වේද වෛද්‍යවරුන්ගේ විශේෂ නාමලේඛනයක් හෝ ආයුර්වේද විශේෂඥ වෛද්‍යවරුන්ගේ නාමලේඛනයක් ඊට ඇතුළත් වේ;

(7) "ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරු" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

"ලියාපදිංචි ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන්" යන්නෙන්, මේ පනත යටතේ ආයුර්වේද සම්බාහන ශිල්පියකු හෝ සම්බාහන ශිල්පිනියක ලෙස ලියාපදිංචි තැනැත්තකු අදහස් වේ;

"ආයුර්වේද විශේෂඥ වෛද්‍යවරුන්ගේ නාමලේඛනය" යන්නෙන්, මේ පනත යටතේ ආයුර්වේද විශේෂඥ වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාව විසින් පවත්වාගෙන යන ලේඛනය අදහස් වේ;

"ආයුර්වේද සම්බාහන ශිල්පීන්ගේ හෝ සම්බාහන ශිල්පිනියන්ගේ නාමලේඛනය" යන්නෙන්, මේ පනතේ ආයුර්වේද සම්බාහන ශිල්පීන් හෝ සම්බාහන ශිල්පිනියන් ලියාපදිංචි කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාව විසින් පවත්වාගෙන යන ලේඛනයක් අදහස් වේ;

"ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලය" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 139 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලය අදහස් වේ;

"ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලය" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 139 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලය අදහස් වේ.".

සැක දුරු කිරීම

**47.** මේ පනතේ විධිවිධාන, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ කලින් කරන ලද යම් ක්‍රියාවකට හෝ කලින් ගන්නා ලද යම් තීරණයකට බල නොපෑ යුතු බවට හෝ බලපා ඇති බවට සලකනු නොලැබිය යුතු බවට සැක දුරු කිරීම සඳහා, මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ අවස්ථාවක දී, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**48.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.